[redacted]

# පළමු වාර පරීක්ෂණය - 2018

## ගණිතය

**6 ශ්‍රේණිය**

නම :


කාලය පැය 01 යි.

### I කොටස

01. පහත සඳහන් ද්‍රව්‍ය අතරින් වෘත්තාකාර හැඩය දැකිය හැකි ද්‍රව්‍ය තෝරා ලියන්න.
 රබාන , ගණිතය පෙළ පොත, රෝදය , පිහිය

02. දෙබිලියන තුන්සිය දහස් එකසිය විසි තුන' ඉලක්කමෙන් කලාප වලට වෙන් කර ලියන්න.

03.




A හා B යනු පොත් ගොඩවල් දෙකකි. A පොත් ගොඩේ පොත් 6 ක් තිබේ. B පොත් ගොඩේ පොත් කීයක් තිබේදැයි නිමානය කරන්න.

04. අගය සොයන්න.
 (අ) $24 \times 100$ (ආ) $420 \div 10$


05. කිසියම් ස්ථානයක සිට දිශා නිවැරදිව සොයා ගැනීමට භාවිතා කළ හැකි උපකරණය කුමක් ද?

06. (-2) ට වඩා විශාල නිඛිල දෙකක් පහත සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න.




07. 2 425 සංඛ්‍යාවේ 4 ඉලක්කමේ පිහිටි ස්ථානයේ ස්ථානීය අගය කුමක් ද?

08. පහත දැක්වෙන කෝණ අතරින් සුළු කෝණයක් දැක්වෙන රූප සටහන යටින් ඉරක් අඳින්න.




09. සුරෙගේ පාසල් වෑන් රථය නිවස අසලට පැමිණෙන්නේ පෙ.ව. 6.45 ට වන අතර 7.10 වන විට වෑන් රථය පාසල ඉදිරිපිටට පැමිණෙයි. වෑන් රථයට සුනෙරගේ නිවසේ සිට පාසලට පැමිණීමට ගත වන කාලය සොයන්න.

10. පෙ.ව. 9.00 ට නැගෙනහිරට මුහුණලා සිටින පුද්ගලයෙකුගේ සෙවනැල්ල වැටෙන දිශාව කුමක් ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

11. 4056 + 150 සුළු කරන්න.

12. 7 හි පළමු ගුණාකාර 04 ලියන්න.

13. 8 452 සංඛ්‍යාවේ 4 න් නිරූපිත අගය 5 න් නිරූපිත අගය මෙන් කී ගුණයක් ද?

14. > හෝ < අසමානතා ලකුණු යොදමින් පහත දැක්වෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) (-5) .................... (-7)  (ii) 6 ............... (-5)

5 026 ගණක රාමුවක දක්වන්න.

16. අඹ ගොඩක ඇති අඹ.ගෙඩි ගණන ආසන්න 10 ට වැටයූ විට 80 කි. අඹ ගොඩේ තිබිය හැකි උපරිම අඹ ගෙඩි ගණන සොයන්න.


17. ග්‍රාමීය පුස්තකාලයකට පොත් මිලදී ගැනීමට දෙදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් එක් එක් අය සමාන මුදල් ප්‍රමාණයක් බැගින් රු.8 715 කමුදලක් පරිත්‍යාග කරන ලදී. එක් අයෙකු විසින් ප්‍රධානය කරනු ලැබූ මුදල කොපමණද?

18. උතුරු දිශාව සමග සෘජුකෝණයක් සාදන දිශා දෙක ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

19. 1526004020 යන සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා සංඛ්‍යා නාමය ලියන්න.

20. ඔරලෝසු මූණතේ දැක්වෙන්නේ අමායා රාත්‍රී නින්දට යන වේලාවයි. එම වේලාව අන්තර්ජාතික සම්මත ආකාරයට ලියන්න.



## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. (A) කණ්ඩායම් ක්‍රියාකාරකමකදී ගුරුතුමිය විසින් ඔබ කණ්ඩායමට දෙන ලද කාඩ්පත් පහත රූපයේ දක්වා ඇත.

| 1 | 8 | 9 | 3 | 6 | 4 | 5 |
|---|---|---|---|---|---|---|

(i) ඉහත කාඩ්පත් 7 ම භාවිතයෙන් සෑදිය හැකි විශාලම සංඛ්‍යාව කලාප වලට වෙන් කර ලියන්න.

(ii) එම සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

(iii) ඉහත කාඩ්පත් 7 න් අඩුම විශාලත්වයක් ඇති කාඩ්පත් 4 ඇඳ පෙන්වන්න.

(iv) එම කාඩ්පත් 4 ම භාවිතයෙන් සෑදිය හැකි විශාලම සංඛ්‍යාව හා කුඩාම සංඛ්‍යාව අතර වෙනස සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(v) එම සංඛ්‍යාව ගණක රාමුවක දක්වන්න.


(vi) එම සංඛ්‍යාවේ 1 ඉලක්කමේ ස්ථානීය අගය කුමක් ද?

(vii) එම සංඛ්‍යාවේ 3 ඉලක්කමෙන් නිරූපණය වන අගය ලියන්න.

(B) අගය සොයන්න.

(i) $56 \times 74$ (ii) $882 \div 14$

02.




A, B, C, D සහ E නම් යහලුවන් පස් දෙනෙක්ගෙන් A , B හා C යහලුවන් ගණිත ඇගයීම් පරීක්ෂණයකදී ලබාගත් ලකුණු ඉහත සංඛ්‍යා රේඛාව මත දක්වා ඇතත

(i) A, B හා C යහලුවන් ලබාගත් ලකුණු වෙන වෙනම ලියන්න.

(ii) D යහලුවා ලකුණු 89 ක් ද , E යහලුවා ලකුණු 82 ක් ද ලබාගත්තේ නම් ඔවුන් දෙදෙනා ලබාගත් ලකුණු ඉහත සංඛ්‍යාරේඛාව මත ලකුණු කරන්න.


(iii) ලකුණු 80 හා 80 ට වැඩියෙන් ලබාගත් යහලුවන් කී දෙනෙක් සිටී ද?

(iv) වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබාගත් යහලුවා අඩුම ලකුණු ප්‍රමාණයක් ලබාගත් යහලුවාට වඩා කොපමණ ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇත් ද?

(v) ලබාගත් ලකුණු අනුව A, B, C, D හා E යහලුවන් අවරෝහණ පිළිවෙලට පෙළ ගස්වන්න.

(vi) සංඛ්‍යා රේඛාවක ඇති විශේෂ ලක්ෂණයක් ලියන්න.

03. (A) ඉහත දැක්වෙන්නේ සරඹ සංදර්ශනයකදී සිසුන් කණ්ඩායමක් එක් අවස්ථාවකදී පෙළ ගැසී සිටි ආකාරයයි.



a - සෘජු කෝණයකි

b - මහා කෝණයකි

c - පරාවර්ත කෝණයකි

d - සුලු කෝණයකි

දී ඇති රූපයේ ලකුණු කර ඇති කෝණ වලට අදාළ නිවැරදි ඉංග්‍රීසි සිම්පල් අකුර අදාළ කෝණය තුළ ලියන්න.

(B) පහත දක්වා ඇත්තේ බිත්තියක සවිකර ඇති පරෙවි කූඩු සමූහයක දළ සටහනකි.

පරෙවියන් සිටින කූඩු වල පරෙවියන් P, Q, R, S, T හා U ලෙස නම් කර ඇත.

| | | | |
|---|---|---|---|
| | Q | | T |
| S | | U | R |
| | P | | |

(i) P පරෙවියාට සිරස්ව සිටින පරෙවියා නම් කරන්න.

(ii) R පරෙවියාට තිරස්ව සිටින පරෙවියන් නම් කරන්න.

(iii) T පරෙවියාට සිරස්ව පහළින් සිටින පරෙවියා නම් කරන්න.

04. වේදිකා නාට්‍ය සංදර්ශනයක පාසල් ප්‍රදර්ශන වාර ගනන වන්නේ පෙ.ව. 10.00 සහ පෙ.ව. 1.00 දර්ශනයයි. පෙ.ව.10.00 ප්‍රදර්ශන වාරය සඳහා ළමයින් 825 ක් ද ප.ව.1.00 ප්‍රදර්ශන වාරය සඳහා ළමයින් 1170 ක් ද සහභාගි විය.

(i) ප්‍රදර්ශන වාර දෙකේදීම නාට්‍ය නැරඹීමට පැමිණි ළමයින් ගණන කොපමණ ද?

(ii) වැඩි ළමයින් ගණනක් පැමිණියේ කුමන ප්‍රදර්ශන වාරය නැරඹීමට ද?

(iii) එම වැඩිපුර ළමයින් ගණන කොපමණ ද?

(iv) නාට්‍ය සංදර්ශන වාර දෙකම නැරඹීමට පැමිණි මුලු ගැහැණු ළමයින් ගණන 1025 ක් නම් නාට්‍ය නැරඹූ මුලු පිරිමි ළමයින් ගණන සොයන්න.

(v) ටිකට්පතක් 25/- ක් මිල වූයේ නම් පළමු දර්ශන වාරයේ දී ලැබුණු ආදායම සොයන්න.

05. (A) සිසුන් තිදෙනෙක් එළිමහනේ, රූපයේ පෙනෙන ආකාරයට වෘත්තයක් ඇඳ ඊට මීටර් කිහිපයක් ඈතින් සිට ඇඳ ඇති වෘත්තය දෙසට උළු කැට කැබැල්ලක් විසි කරනු ලැබේ.

උළු කැට කැබැල්ල වැටෙන ස්ථානය අනුව. පහත ආකාරයට ලකුණු පිරිනමනු ලැබේ.


වැඩිම ලකුණු ලබාගත්තාට ජයග්‍රහණය පිරිනමන අතර එක් අයෙකුට වාර තුනක් ලබා දේ.

උළු කැටය වෘත්තය තුළට වැටුණු විට - ලකුණු 05

උළු කැටය වෘත්තය මතට වැටුණු විට - ලකුණු 10

උළු කැටය වෘත්තයෙන් පිටතට වැටුණු විට - ලකුණු 0

To download past papers visit www.vajirapani.blogspot.com



තිදෙනා වාර 3 ක දී උළු කැටය වෘත්තය දෙසට විසිකළ ආකාරය පහත වගුවේ දැක්වේ.

| නම | වෘත්තය තුළට | වෘත්තය මතට | වෘත්තයෙන් පිටතට |
|---|---|---|---|
| විහඟ | වාර 01 | වාර 01 | වාර 01 |
| කලන | වාර 02 | - | වාර 01 |
| විදූෂ | - | වාර 02 | වාර 01 |

(i) විහඟ ලබාගත් ලකුණු කොපමණ ද?

(ii) කලන ලබාගත් ලකුණු කොපමණ ද?

(iii) විදූෂ ලබාගත් ලකුනු කොපමණ ද?

(iv) මේ අනුව ජයග්‍රාහකයා නම් කරන්න.


(v) විහඟ උලු කැට කැබැල්ල වෘත්තය තුළට දැමූ ස්ථානය A ලෙස ද, වෘත්තයෙන් පිටතට දැමූ ස්ථානය B ලෙස ද, වෘත්තය මතට දැමූ ස්ථානය C ද නම් ඉහත වෘත්තයේ එම A , B , C ස්ථාන ලකුණු කර පෙන්වන්න.

(B) පහත දැක්වෙන සංඛ්‍යා ආසන්න 10 ට වටයා ලියන්න.

(i) 52

(ii) 185

06. (A)




To download past papers visit
www.vajirapani.blogspot.com

රූපයේ දැක්වෙන්නේ පන්ති කාමරයක යහලුවන් 9 දෙනෙකු අසුන්ගෙන සිටින අකාරයයි. පන්ති කාමරයේ උතුරු දිශාවේ ගුරු මේසය තබා ඇත.

(i) නිසල්ට ඊසාන දිශාවෙන් අසුන්ගෙන සිටින්නේ කවු ද?

(ii) මහිල්ට බටහිර දිශාවෙන් අසුන්ගෙන සිටින්නේ කවු ද?

(iii) නිසල් සහ මහිල් අසුන්ගෙන සිටින්නේ චාමරට කුමන දිශාවෙන් ද?

(B) (i) නිරූපා සෙනසුරාදා දින වල අමතර පන්ති වලට සහභාගි වීම සඳහා නිවසින් පිටත් වන්නේ පෙ.ව. 8.00 ට වන අතර ඇය නැවත නිවසට පැමිණෙන්නේ ප.ව. 12.15 ටය.
නිරූපා සෙනසුරාදා දිනවල නිවසින් බැහැරව ගත කරන කාලය කොපමණ ද?

(ii) එක්තරා වෙළඳ දැන්වීමක් ප්‍රචාරණ කාලය මිනිත්තු 1 තත්පර 20 ක් නම් එම වෙළඳ දැන්වීම 10 : 10 : 28 ට ආරම්භ වේ නම්, වෙළඳ දැන්වීම ප්‍රචාරය කර අවසන් කරන වේලාව සොයන්න.

(ii) මෙම වර්ෂයේ වෙසක් පොහොය අප්‍රේල් මස 31 දිනට යෙදී ඇත. එම දිනය අන්තර්ජාතික සම්මත ක්‍රමයට ලියා දක්වන්න.